# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1872/32 - 2014 ජූලි මස 25 වැනි සිකුරාදා - 2014.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### තැපැල් කාර්යාල ආඥාපනත

උක්ත කරුණ සම්බන්ධ නිවේදනය පළ කරන ලද අංක 1871/17 සහ 2014 ජූලි මස 14 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*, මෙම *අතිවිශෙෂ ගැසට් පත්‍රය* පළ කරනු ලබන දින සිට අවලංගුවේ.

ලේකම්,
තැපැල් සේවා අමාත්‍යාංශය.

2014 ජූලි මස 25 වැනි දින,
කොළඹ දී ය.

### තැපැල් කාර්යාල ආඥාපනත

(190 වැනි අධිකාරිය වන) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 6,10,12,19,21,25,27,43,44,59 සහ 68 යන වගන්ති යටතේ තැපැල් සේවා අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව සම්පාදනය කරන ලද ව්‍යවස්ථාව.

ජීවන් කුමාරණතුංග,
තැපැල් සේවා අමාත්‍ය.

2014 ජූලි මස 25 වැනි දින,
කොළඹ දී ය.

ව්‍යවස්ථාව

1934 නොවැම්බර් මස 30 වැනි දින අංක 8093 දරන *ගැසට් පත්‍රයේ* අතිරේකයෙහි පළකරනු ලැබූ සහ තදන්තර යම් ව්‍යවස්ථාවකින් සංශෝධිත 1934 මෙරට තැපැල් ව්‍යවස්ථාව 2007.04.25 දින අංක 1494/10 දරන *අතිවිශෙෂ ගැසට් නිවේදනයෙන්* සංශෝධනය කරන ලදුව තවදුරටත් 2014 අගෝස්තු මස 01 දින සිට පහත සඳහන් පරිදිවන ව්‍යවස්ථා පමණක් මෙමගින් සංශෝධනය කරනු ලැබේ ඃ

1. 12 වන ව්‍යවස්ථාවේ (1) ඡේදයේ ග්‍රෑම් 30ක් යන්න වෙනුවට ග්‍රෑම් 20ක් යන්න හා රුපියල් 5.00 යන ඉලක්කම වෙනුවට රුපියල් 10.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

1A - PG 2120— 6,000 (2014/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. 21 වන ව්‍යවස්ථාවේ ග්‍රෑම් 30ක් යන්න වෙනුවට ග්‍රෑම් 20ක් යන්න හා රුපියල් 4.50 යන ඉලක්කම වෙනුවට රුපියල් 7.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

3. 19 වන ව්‍යවස්ථාවේ රුපියල් 4.00 යන ඉලක්කම වෙනුවට රුපියල් 8.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

4. 27 වන ව්‍යවස්ථාවේ (2) ඡේදයේ සෑම ග්‍රෑම් 500ක් යන්න වෙනුවට පළමු ග්‍රෑම් 250ක් යන ඉලක්කම ද, රුපියල් 50.00 යන්න වෙනුවට රුපියල් 90.00ක් යන්න හා අනුපිළිවෙලින් ඊළඟ ග්‍රෑම් 250 හෝ ඉන් කොටසක් සඳහා රුපියල් 20.00 බැගින් ද, ග්‍රෑම් 500 සිට ග්‍රෑම් 1500 දක්වා වැඩිවන ග්‍රෑම් 500ක් හෝ ඉන් කොටසක් සඳහා රුපියල් 20.00 බැගින් ද, ග්‍රෑම් 1500 සිට ග්‍රෑම් 3000 දක්වා වැඩිවන ග්‍රෑම් 500ක් හෝ ඉන් කොටසක් සඳහා රුපියල් 50.00 බැගින් ද, ග්‍රෑම් 3000 සිට ග්‍රෑම් 4000 දක්වා රුපියල් 50.00 බැගින් ද, ග්‍රෑම් 4000 සිට වැඩිවන ග්‍රෑම් 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 100.00ක් බැගින් ද, වශයෙන් ආදේශ කිරීමෙන් ද ඊට අතිරේකව 1955 වර්ෂයේ අංක 30 දරන සංශෝධිත තැපැල් කාර්යාල ආඥාපනතේ 8 වන ව්‍යවස්ථාවෙන් තැපැල් සේවා අමාත්‍යවරයා වෙත හිමිවී ඇති බලතල ප්‍රකාර දේශීය පාර්සල් ගාස්තු සඳහා රු. 20.00 ස්ථාවර ගාස්තුවක් ද එකතු කිරීමෙන් ද යන්න මින් ඉදිරියට අහෝසි කිරීමෙන් ද,

5. 25 වන ව්‍යවස්ථාවේ (1) ඡේදයේ සෑම ග්‍රෑම් 60ක් යන්න වෙනුවට පළමු ග්‍රෑම් 60ක් යන ඉලක්කම ද රුපියල් 8.00 යන්න වෙනුවට රුපියල් 8.00ක් ද යන්න හා අනතුරුව දෙවන ග්‍රෑම් 60 සඳහා රුපියල් 4.00ක් ද ඊළඟ ග්‍රෑම් 120ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 12.00ක් බැගින් ද යන්න ආදේශ කිරීමෙන් ද,

6. 43 වැනි ව්‍යවස්ථාවේ (2) ඡේදයේ රුපියල් පහ යන වචනය වෙනුවට රුපියල් දහය යන වචනය ආදේශ කිරීමෙන් ද,

7. 59 වන ව්‍යවස්ථාවේ (2) ඡේදයේ රුපියල් 2500.00 යන ඉලක්කම් වෙනුවට රුපියල් 5000.00 යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ද,

8. අංක 1494/10 දරන 2007 අප්‍රේල් 25 වැනි බදාදා අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරමින් ව්‍යවස්ථාව සඳහා 93 වන ඡේදය අලුතින් ඇතුළත් කළ ව්‍යාපාරික තැපැල සඳහා ග්‍රෑම් 30 හෝ ඉන් කොටසක් සඳහා රුපියල් 15.00 යන වගන්තිය වෙනුවට ව්‍යාපාරික තැපැල සඳහා -

පළමු ග්‍රෑම් 20 සඳහා රු. 15.00ක් ද,
ඊළඟ ග්‍රෑම් 100 දක්වා වැඩිවන ග්‍රෑම් 20ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින් ද,
ග්‍රෑම් 100 සිට ග්‍රෑම් 250 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 50ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද,
ග්‍රෑම් 250 සිට ග්‍රෑම් 1000 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 50ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 30.00 බැගින් ද,
ග්‍රෑම් 1000 සිට ග්‍රෑම් 2000 දක්වා වැඩිවන ග්‍රෑම් 250ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 බැගින් ද,

සහ කොළඹ නාගරික බෙදීම් කලාප 15 ඇතුළත බෙදීම සඳහා මධ්‍ය තැපැල් හුවමාරුවෙන් භාරගන්නා ලිපි (අවමය 25000) සඳහා බර ග්‍රෑම් 20 දක්වා වන ලිපියකට රුපියල් 12.00ක් ද යන වගන්තිය ඇතුළත් කිරීමෙන් ද,

9. අංක 1494/10 දරන 2007 අප්‍රේල් 25 වැනි බදාදා අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරමින් ව්‍යවස්ථාව සඳහා 94 වන ඡේදය අලුතින් ඇතුළත් කළ විවෘත ව්‍යාපාරික ලිපි සඳහා ග්‍රෑම් 30ක් හෝ ඉන් කොටසක් සඳහා රුපියල් 12 යන වගන්තිය වෙනුවට මුද්‍රිත ද්‍රව්‍ය විවෘත ව්‍යාපාරික ලිපි සඳහා (උපරිම බර කිලෝ ග්‍රෑම් 2කි).

මුල් ග්‍රෑම් 20ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 12.00ක් ද,
ග්‍රෑම් 40 දක්වා වැඩිවන ග්‍රෑම් 20ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 8.00ක් ද,
ග්‍රෑම් 40 සිට ග්‍රෑම් 100 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 20ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද,
ග්‍රෑම් 100 සිට ග්‍රෑම් 250 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 30ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද,
ග්‍රෑම් 250 සිට ග්‍රෑම් 500 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 50ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද,
ග්‍රෑම් 500 සිට ග්‍රෑම් 1000 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 100ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද,
ග්‍රෑම් 1000 සිට වැඩිවන සෑම ග්‍රෑම් 500ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද, යන වගන්තිය ඇතුළත් කිරීමෙන් ද,

10. ව්‍යවස්ථාව සඳහා 95 වන ඡේදය අලුතින් ඇතුළත් කිරීමෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 12/0823/525/005 ප්‍රකාර තැපැල් දෙපාර්තමේන්තුව හඳුන්වාදෙන අගය එකතු කළ නව සේවාවන් සඳහා පහත ඡේදයන් සඳහා වගන්ති ඇතුළත් කිරීමෙන් ද,

95-I ලොජි පෝස්ට් පාර්සල් සේවාව මගින් යැවිය හැකි උපරිම බර කිලෝ ග්‍රෑම් 40ක් ද ඒ සඳහා අය කරන තැපැල් ගාස්තුව දේශීය පාර්සල් තැපැල් ගාස්තුවට අමතරව එම ගාස්තුවෙන් 50%ක ප්‍රමාණයක් එකතු කිරීමෙන් ද, කිලෝ ග්‍රෑම් 20 සිට ඉදිරියට වැඩිවන සෑම කිලෝ ග්‍රෑම් 1ක් හෝ කොටසක් සඳහා රු. 150.00 බැගින් ද යන වගන්තිය ඇතුළත් කිරීමෙන් ද,

95-II ප්‍රචාරණ තැපැල් ගාස්තුව යටතේ උපරිම බර ග්‍රෑම් 20ක් වන පළමු පත්‍රිකා 1000 සඳහා රු. 6,000.00ක් ද, වැඩිවන

පත්‍රිකා 1,000ක් හෝ කොටසක් සඳහා රු. 5,000.00 බැගින් ද, බර ග්‍රෑම් 20ට වඩා වැඩි සහ ග්‍රෑම් 40 හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1,000 සඳහා රු. 7000.00ක් ද වැඩිවන පත්‍රිකා 1000ක් හෝ කොටසක් සඳහා රු. 6000.00 බැගින් ද, බර ග්‍රෑම් 40ට වඩා වැඩි සහ ග්‍රෑම් 60 හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1000ක් සඳහා රු. 8000.00ක් ද, වැඩිවන පත්‍රිකා 1000ක් හෝ කොටසක් සඳහා රු. 7,000.00 බැගින් ද, ග්‍රෑම් 60 ට වඩා වැඩි සහ ග්‍රෑම් 80 හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1000ක් සඳහා රු. 9000.00ක් ද, වැඩිවන පත්‍රිකා 1000ක් හෝ කොටසක් සඳහා රු. 8000.00 බැගින් ද ග්‍රෑම් 80ට වැඩි වන සහ ග්‍රෑම් 100 හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1000 සඳහා රු. 10,000.00 ක් ද වැඩිවන පත්‍රිකා 1000ක් හෝ කොටසක් සඳහා රු. 9,000.00 බැගින් ද යන වගන්තිය ඇතුළත් කිරීමෙන් ද,

95-III නාමාවලී සහ වාර්තා බෙදීමේ තැපැල් ගාස්තුව සඳහා පළමු ග්‍රෑම් 500 දක්වා මෙහෙයුම් පිරිවැය ඇතුළත්ව රු. 75.00ක්, ග්‍රෑම් 500 සිට 1000 දක්වා මෙහෙයුම් පිරිවැය ඇතුළත්ව රු. 85.00ක් ද, ග්‍රෑම් 1000 සිට ග්‍රෑම් 1500 දක්වා මෙහෙයුම් පිරිවැය ඇතුළත්ව රු. 90.00ක් ද, ග්‍රෑම් 1500 සිට ග්‍රෑම් 2000 දක්වා මෙහෙයුම් පිරිවැය ඇතුළත්ව රු. 100.00ක් ද යන වගන්තිය ඇතුළත් කිරීමෙන් ද (මෙහෙයුම් පිරිවැය රු. 10.00 සිට රු. 15.00 දක්වා වේ.)

95-IV දේශීය අධිවේගී කුරියර් සේවාව වන ස්පීඩ් පෝස්ට් කුරියර් තැපෑලෙන් යැවිය හැකි උපරිම බර කිලෝ ග්‍රෑම් 10කි. ස්පීඩ් පෝස්ට් කුරියර් සේවාව සඳහා කොළඹ බෙදීම් කලාප තුළ හෝ තම බෙදීම් කලාප තුළ භාරගෙන එම කලාපය තුළ බෙදීම සඳහා තැපැල් ගාස්තුව ව්‍යාපාරික ලිපි තැපැල් ගාස්තුවට අමතරව රු. 35.00ක් ද තම බෙදීම් කලාපයෙන් පරිබාහිර සෙසු සියලු ප්‍රදේශවල බෙදීම සඳහා ව්‍යාපාරික ලිපි තැපැල් ගාස්තුවට අමතරව රු. 50.00ක් ද ව්‍යාපාරික ලිපියක උපරිම බර වන කිලෝ ග්‍රෑම් 2 සිට වැඩිවන සෑම කිලෝ ග්‍රෑම් 1ක් හෝ කොටසක් සඳහා රු. 100.00ක් බැගින් ද,

95-V (6 වන ව්‍යවස්ථාවේ (ii) ඡේදයේ රුපියල් 20.00 යන ඉලක්කම් වෙනුවට) තැපැල් භාණ්ඩයක් හෝ කිහිපයක් සඳහා තැපැල් කිරීමේ සහතිකයක් ලබාදීමේ ගාස්තුව එක් භාණ්ඩයක් සඳහා රු. 40.00 ක් ද, භාණ්ඩ 02 සිට 100 දක්වා රු. 50.00 ක් ද, භාණ්ඩ 101 සිට 500 දක්වා සඳහා රු. 60.00ක් ද, භාණ්ඩ 500ට වැඩි රු. 100.00 ක් ද යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ද,

95-VI (44 වන ව්‍යවස්ථාවේ (1) (ආ) ඡේදයේ රු. 35.00 යන ඉලක්කම් වෙනුවට) ගමනාන්ත කාර්යාලයේ දී හෝ මාර්ගස්ථ කාර්යාලයේ දී සෙවීමේ ගාස්තුව රු. 25.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

95-VII (68 වන ව්‍යවස්ථාවේ රු. 25.00 යන ඉලක්කම් වෙනුවට) ලියාපදිංචි ලිපි කුවිතාන්සියක සහතික කළ පිටපතක් සඳහා ගාස්තුව රු. 50.00 යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ද,

95-VIII තැපැල් හැඳුනුම්පතක් එක් දින සේවාව සඳහා රු. 100.00ක් ද,

95-IX තැපැල් මල්ලක වටිනාකම (ලොකු) මි. මී. 970x510 සඳහා රු. 7,500.00ක් ද (කුඩා) මි. මී. 760x430 සඳහා රු. 5,000.00ක් ද අතිරේක යතුරක් සඳහා රු. 500.00ක් ද,

95-X තොග තැපැල් පහසුකම් (M සේවාව) සඳහා ප්‍රථම වරට ලියාපදිංචිවීමේ ගාස්තුව රු. 5,000.00ක් ද වාර්ෂික අලුත් කිරීමේ ගාස්තුව රු. 3,000.00ක් ද.

08-410

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.